---

කුරුණෑගල මහානගර සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මහානගර සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මහානගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ). සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අතැති ගබඩා තොගය වූ රු.31,637,495 ක් ගිණුම් ගත කිරීමේදී සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩ සමීක්ෂණයක් කර ඒ අනුව තොගය ආගණය කර නොතිබූ අතර ලෙජර් ගිණුම් අනුව ආරම්භක ශේෂයට ගබඩා ලැබීම් හා ගබඩා නිකුත් කිරීම් ගැලපීමෙන් පසු පැන නැගි ශේෂය ගිණුම් ගතකර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුල ඉකුත් වර්ෂ වලට අදාල ගැලපුම් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට අනුව පිළිවෙලින් රු.3,398,826 ක් හර ලෙසද රු.103,725,470 ක් බැර ලෙසද ගැලපුම් සිදුකර ඉකුත් වර්ෂයේ පැවති මූල්‍ය ප්‍රතිඵලය වු රු.32,603,922 ක ප්‍රමාණය අදාල ගැලපුම් හේතුවෙන් රු.132,930,566 ක් ලෙස සංශෝධනය වී පැවතුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟ තානායම් ගාස්තු ලෙස රු.1,530,781 ක ප්‍රමාණයක් පැවති අතර තානායම් කුලී අයවීම් පිළිබඳ ගැටළු නිසා අදාල මුදල් දිගින් දිගටම අයවී නොපැවතියද ඒ පිළිබඳව අවසන් මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 11 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.13,135,154 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.12,179,909 ක් විය.

1.3.3 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතුව ගිණුම් ශේෂවල වටිනාකම රු. 65,036,228 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2011 ජූනි 30 දින වන විට විගණන විමසුම් 02 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුනි.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.67,464,341 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහා නගර සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.55,573,017 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.47,934,097 ක් විය.

2.2 මූල්‍ය පාලනය

(අ) බැංකු ගිණුම් 03 ක ට අදාලව තැන්පත් කල නමුත් උපලබ්ධි නොවු රු.750,512 වටිනා චෙක්පත් 54 පැවතුණි.

(ආ) බැංකු ගිණුම් 03 කට අදාලව පැවති රු.626,836 ක අගරු චෙක්පත් 15 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) බැංකු ගිණුමකට අදාලව හඳුනා නොගත් හර රු. 34,076 ක් ද හඳුනා නොගත් බැර රු. 380,368 ක් පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තු ගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇසතමේන්තු ගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 29,500 | 34,451 | 20,495 | 29,100 | 34,070 | 13,826 |
| (ii) | බදුකුලී | 43,949 | 48,768 | 2,404 | 44,602 | 45,174 | 5,278 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,700 | 4,005 | 278 | 6,170 | 4,424 | 705 |
| (iv) | වෙනත් ආදායම් | 88,615 | 66,249 | 64,611 | 87,753 | 59,873 | 63,419 |
| | එකතුව | 165,764 | 153,473 | 87,788 | 167,625 | 143,541 | 83,228 |

2.3.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයකින් 2010 දෙසැම්බර් 31 දක්වා අය කර ඇති රු.1,698,309 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.3.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.15,523,467 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3.4 මස්කඩ හා මාළුකඩ බදු

(I). මධ්‍යම වෙළඳ පල මස් කඩ 4 ක් හා තෙලියාගොන්න මස් කඩයක් 2005 වර්ෂයට අදාලව බදුගෙන තිබූ බදුකරුගෙන් අයවිය යුතු රු.1,021,736 ක හිඟ කුලී අයකර ගැනීම සඳහා 2006 වර්ෂයේ නඩු පවරා සමාලෝචිත වර්ෂය අවසාන වන විට නඩු වාර 37 ක් ගතවී ඇතත්, අදාල නඩු සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම නිරවුල් වී නොතිබුණි. එමෙන්ම මධ්‍යම වෙළඳපල මස් කඩ 2 ක් 2006 වර්ෂයට අදාලව බදුගෙන තිබූ බදුකරුගෙන් අයවිය යුතු රු.303,928 ක් අයකර ගැනීම සඳහා නඩු පැවරීම 2010 ජූලි 08 දක්වා ප්‍රමාදව සිදුව තිබුණි.

(II). සමාලෝචිත වර්ෂයට අදාලව නගර සභාවේ මස් කඩ හා මාළු කඩ 13 ක් බදුදීම සඳහා වූ ලංසු දැන්වීම ගැසට් පත්‍රයක හෝ පුවත්පතක පලකර ප්‍රසිද්ධියට පත්කර නොතිබූ අතර, සභා බල ප්‍රදේශයේ දැන්වීම් පලකර ප්‍රසිද්ධියට පත්කිරීම පමණක් සිදුකර තිබුණි. එයින් සමාලෝචිත වර්ෂයට අදාලව බදු දී තිබුනේ ගිවිසුම් ගත වටිනාකම රු.489,060 ක් වූ වත්කම් 4 ක් පමණි.

2.3.5 ජල ගාස්තු

(I). සභා සීමාව තුල ජල පාර්භෝගිකයන් වෙත ජලය සපයන තැම්පාන ජල මූලාශ්‍රයේ ජල පාර්භෝගිකයින් 17 කට අදාලව 2010 දෙසැම්බර් 31 දිනට රු.145,692 ක හිඟ ජල ගාස්තුවක් පැවති අතර, ජල පාර්භෝගිකයින් 09 දෙනෙකුට අදාලව 2008 සිට 2010 කාලය තුල විවිධ අවස්ථා වලදී ඔවුන්ගේ ජල සැපයුම් විසන්ධි කර පැවතියද එකී ජල පාර්භෝගිකයින්ට අදාලව රු.89,938 ක හිඟ ජල ගාස්තු ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද පැවතුණි.

(II). ජල ගාස්තු යටතේ වාර්ෂික බිල් කිරීම් මත 48% ලෙස රු.35,618,047 ක හිඟ ජල ගාස්තු ශේෂයක් පැවතුණි. ව්‍යාපාරික ස්ථාන යටතේ බිල්කර තිබූ ජල පාර්භෝගිකයන් 75 කට අදාලව රු.3,460,126 ක හිඟ ශේෂයක් සමාලෝචිත වර්ෂයේ ජූලි මාසය අවසානය වන විට පැවති අතර, ඉහත පරිදි රු.මිලියන 3 ක පමණ හිඟයක් වර්ධනය වන තුරු එකී ජල පාර්භෝගිකයන් වෙත ජල සැපයුම් ලබාදී තිබුණි.

2.3.6 කඩ කාමර බදු

එකවර ගෙවන මුදල් යටතේ (කීමනී) 2007 වර්ෂයේදී ලබාදී තිබූ කුරුණෑගල බස් නැවතුම්පල කඩ කාමර 33 කට අදාලව වාරික 3 ත් 45 ත් අතර පරාසයක විහිදී තිබූ රු284,015 ක එකවර ගෙවන මුදල් හිඟ ශේෂයක්ද වාරික 3 - 45 ක පරාසයක විහිදී තිබූ රු.371,895 ක කුලී හිඟ ශේෂයක් ද සමාලෝචිත වර්ෂය අවසානය වන විට පැවතුණි.

2.3.7 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය වන විට බිල් කිරීම් මත 46% ක ලෙස රු.20,495,420 ක හිඟ වරිපනම් ශේෂයක් පැවතුණි.

2.3.8 වත්කම් බදුදීම

අවම ලංසුව රු.1,662,480 ක් වූ වත්කම් 09 ක් සමාලෝචිත වර්ෂයට අදාලව බදුදීමට නොහැකි වී තිබුණි. එමෙන්ම මෙකී වත්කම් 2007, 2008 හා 2009 වර්ෂ වලදී ද බදුදී නොතිබූ අතර, එකී වත්කම් වල අවම ලංසුව මත වූ කුලී වටිනාකම් රු.3,899,280 ක් විය. එමෙන්ම 2010 අගෝස්තු මාසයේදී සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී සභා බල ප්‍රදේශය තුල වෙළඳ අයිතිය ලබා නොගෙන මස් මාළු අලෙවි කරන ස්ථාන 13 ක් පමණ හඳුනාගත හැකි විය.

2.3.9 ත්‍රීරෝද නැවතුම් ගාස්තු

2006 අගෝස්තු 30 දිනැති 2005(45) දරණ සභා සම්මුතිය අනුව සභා සීමාව තුල අනුමත තරෝද නැවතුම්පල වල නවතා තබන ත්‍රීරෝද රථ සඳහා රු.1,000 ක ලියාපදිංචි ගාස්තුවක් හා මාසිකව රු.300 ක ගාස්තුවක් අයකිරීමට තීරණය කර තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී එකී ක්‍රියාවලිය විධිමත්ව සිදු නොවූ අතර දෛනික ගාස්තුව ලෙස රු 20 ක් ලෙස අයකිරීම පමණක් සිදුව තිබුණි. "මාසිකව ගාස්තු අයකිරීම අසීරු බවත්, ඒ වෙනුවට දෛනකව මුදල් අයකරන බවත් " නගරාධිපතිවරයා 2010 දෙසැම්බර් 09 දින මා වෙත දන්වා තිබුණි.

2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත රු.000 | තථ්‍ය රු.000 | විචලනය රු.000 | අයවැයගත රු.000 | තථ්‍ය රු.000 | විචලනය රු.000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 156,636 | 138,215 | 18,421 | 157,036 | 130,442 | 26,594 |
| අනෙකුත් | 144,505 | 123,889 | 20,616 | 445,034 | 120,533 | 324,501 |
| උප එකතුව | 301,141 | 262,104 | 39,037 | 602,070 | 250,975 | 351,095 |
| ප්‍රාග්ධන වියදම | 142,970 | 46,978 | 95,992 | 147,545 | 35,310 | 112,235 |
| මුළු එකතුව | 444,111 | 309,082 | 135,029 | 749,615 | 286,285 | 463,330 |

2.5 මානව සම්පත් කළමණාකරණය

2.5.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 09 | 09 |
| ද්විතියික | 87 | 73 |
| ප්‍රාථමික | 347 | 312 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 177 |

2.5.2 තනතුරු පුරප්පාඩු පැවතීම

සභාවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව ආදායම් පරිපාලක තනතුරු 2 ක් හා ආදායම් පරීක්ෂක තනතුරු 5 ක් පැවතියද ඒ යටතේ ස්ථිර ආදායම් පරිපාලකවරු දෙදෙනෙකු පමණක් සමාලෝචිත වර්ෂයට අදාලව සිටි අතර, පුරප්පාඩු සඳහා තාවකාලික පදනමට වෙනත් අංශ වලින් ආදායම් පරීක්ෂකවරු තිදෙනෙකු අනුයුක්ත කර පැවතුණි. තාවකාලික ආදායම් පරීක්ෂක තනතුරට අනුයුක්ත කල තිදෙනා සඳහා පළාත් පාලන කොමසාරිස් ගේ 1997 සැප්තැම්බර් 01 දින අංක 1997/9 දරණ චක්‍රලේඛ විධිවිධාන අනුව ලබාගත යුතු සේවක ඇප තබාගෙන නොතිබූ අතර, ඔවුන්ගෙන් නිත්‍ය තනතුරට අදාල රු.3,000 ක් වූ ඇප මුදල පමණක් ලබාගෙන තිබුණි.

2.6 වත්කම් කළමණාකරණය

2.6.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.98,158,979 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.64,692,286 ක් විය.

2.6.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.2,016,339 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.869,876 ක් විය.

2.6.3 අචල ජංගම වත්කම්

ලෙජර් ගිණුම් අනුව 2008 වර්ෂයේ සිට පැවත එන රු.303,530 ක විදුලිය ගබඩා තොග ශේෂයක් පැවතුණි.

2.6.4 සමීක්ෂණය නොකළ වත්කම්

භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.146,665,585 ක් විය.

2.7 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

කුරුණෑගල මහනගර සභාව විසින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් මිළදීගත් ජල ඒකක ප්‍රමාණය හා ජල පාරිභෝගිකයන් යටතේ බිල් කල ඒකක ප්‍රමාණය හා සැසඳීමේදී මිලදී ගත් ඒකක ප්‍රමාණයට සාපේක්ෂව බිල්කල ඒකක ප්‍රමාණයෙහි ඒකක 900,000 ලෙස 40% ක පමණ වෙනසක් වාර්ෂිකව පැවති අතර, මෙය තොග ජල ඒකක පිරිවැය සමඟ සැසඳීමේදී දළ වශයෙන් රු.14,283,000 ක අගයක් විය. " ජල නල පුපුරායාම, පොදු ජල කරාම හා සභාවේ පරිභෝජනය

කරන ජලය ප්‍රමාණයන් බිල් නොකිරීමද මෙම විෂමතාවයට හේතු වී ඇති බව" 2010 දෙසැම්බර් 02 හා 2011 අප්‍රේල් 26 දින කරුණු පැහැදිලි කිරීම අනුව නාගරික කොමසාරිස් වරයා විසින් මා වෙත දන්වා තිබුණි. එමෙන්ම 2009 වර්ෂයේ සිට පැවත එන රු.589,890 ක හඳුනා නොගත් තොග ජල බිල් ශේෂයක්ද පැවතුණි.

2.8 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

තැම්පාන ජල මූලාශ්‍රය යටතේ මහනගර සභා සීමාවේ මාවත් 03 ක ජල පාරිභෝගිකයන් 789 කට මාසිකව ජල ඒකක 7500 ක් පමණ බෙදාහැර පැවතියද අඛණ්ඩව එකී සැපයුම් ලබාදීම සඳහා තැම්පාන ජලාශයේ ජල ධාරිතාව ප්‍රමාණවත් නොවූ අතර, එවැනි අවස්ථා වලදී ජල සම්පත් හා ජලාපවාහන මණ්ඩලයෙන් මිලදී ගත් ජලයෙන් එකී පාරිභෝගිකයන් වෙතද ජලය බෙදාහැර පැවතිණි. එහෙත් එලෙස බෙදාහැරි කාලවකවානු, ඒ සඳහා පාවිච්චි වූ ජල ඒකක ප්‍රමාණය ආදිය වෙනම හඳුනා ගැනිමට මහනගර සභාව අපොහොසත් වී තිබුණි.

2.9 <u>කොම්පෝස්ට් බැරල් නිෂ්පාදන ව්‍යාපෘතිය</u>

(අ) සභාව විසින් ක්‍රියාත්මක කොම්පෝස්ට් බැරල් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා 2007 හා 2009 කාල පරිච්ඡේදය තුල ආයතන 3ක් යටතේ රු.1,707,385 ක ප්‍රතිපාදනයක් සභාවට ලැබී තිබුණු අතර එකී ප්‍රතිපාදනයන් මත ඒ ඒ ප්‍රභවයන් යටතේ නිෂ්පාදිත, බෙදාහැරි හා ඉතිරි බැරල් ප්‍රමාණය කොපමණද යන්න වෙන වෙනම හඳුනාගත හැකි ලෙස පොත් පත් පවත්වා නොතිබුණි. 2010 ඔක්තෝබර් 6 දින සිදුකල භෞතික පරීක්ෂාව අනුව බැරල් 151 ක් පැවති අතර එකී බැරල්ද කුමන අරමුදල් ප්‍රභවයන් යටතේ නිෂ්පාදනය කල ඒවාද යන්න වෙන වෙනම හඳුනාගත නොහැකි විය. මෙකී ප්‍රභවයන් 3 යටතේ ම බෙදාහැරි බැරල් ප්‍රමාණය 923 ක් වූයෙන් නිෂ්පාදිත බැරල් ප්‍රමාණය 1074 ක් ලෙස හඳුනාගත හැකි විය. 2009 වර්ෂය ආරම්භයේ සිට මෙකී ව්‍යාපෘතිය යටතේ නිෂ්පාදනයක් සිදුව නොතිබූ අතර 2007 වර්ෂයේදී මෙකී කාර්ය සඳහා රු 100,000 වැයකර ඉදිකර තිබූ ගොඩනැගිල්ල හා රු.8,340 ක් වැයකර මිලදී ගෙන තිබූ බැරල් අච්චුද 2009 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසානයට බැරල් 151 ක බෙදා නොහැරි ශේෂයක් ද පැවතුනි.

(ආ) මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ පිරිවැය රු.2,200 ක් වූ කොම්පෝස්ට් බැරල් 600 ක් 50% සහන පදනම මත රු.743,061 ක් වැය කර 2009 වර්ෂයේදී ලබාගෙන තිබුණ අතර, මෙයින් බැරල් 192 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම බෙදාහැර නොතිබුණි. 2010 ඔක්තෝබර් මස 6 දින කල ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව එලෙස ලබාගෙන තිබූ බැරල් තට්ටු වලින් 10 ක් පමණ ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස විනාශ වී පැවතුණි. සභාව විසින් නිෂ්පාදනය කරන ලද බැරලයක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය රු.1,500 ක් පමණ වූ අතර මෙකී ව්‍යාපෘතිය යටතේ ලබාගත් බැරලයක පිරිවැය රු.2,200 ක් පමණ විය. බැරල් තට්ටු කැඩී පැවතිම හා ඒ සඳහා භාවිතා කල කම්බි අඟල් 1/8 ඝණකම් කම්බි ලෙස හඳුනාගත හැකි වීමෙන් මෙකී බැරල් සභාවේ නිෂ්පාදන බැරල් වලට වඩා ගුණාත්මක භාවයන් අඩු බැරල් ව පැවතුණි.

2.10 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) මූල්‍ය පාලනය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමණාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය